නාවලපිටිය නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 10 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි එකතු වටිනාකම රු.2,152,478 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ මිලදී ගැනීම් රු.894,959 ක් වුවත්, එය රු.1,443,538 ක් ලෙස රු.548,579 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය සඳහා මුද්දර ගාස්තු රු.6,860,670 ක් ලැබී තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා රු.2,500,000 ක් පමණක් ප්‍රතිපාදන සලසා තිබූ අතර, එය පෙර වර්ෂයට වඩා රු.4,360,670 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.281,789 ක් අනුමැතියකින් තොරව ගිණුම්වලින් කපාහැර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ගබඩා ගිණුම් ශේෂය රු.693,452 ක් වුවත් එය රු.93,452 ක් ලෙස රු.600,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී සෞඛ්‍ය සේවා ව්‍යාපෘතියේ ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වැය රු.100,000 ක් ආදායම් හා වියදම් ගිණුමට ගෙන නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
-------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.10,392,394 ක් වූ ගිණුම් ශේෂ 3 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.4,358,165 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

---------------------

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 3 ක එකතු වටිනාකම රු.10,442,246 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.2,093,317 ක් හා වසර 5ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.7,765,000 ක් වී තිබුණි.

(ii) ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට 2014 සිට 2016 දක්වා කාලයට ලබා දුන් කොම්පෝස්ට් පොහොර වෙනුවෙන් රු.878,955 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතු වටිනාකම රු.21,350,519 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.2,844,241 ක් හා වසර 5ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.7,523,725 ක් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.450,602 ක් වූ ගනුදෙනු 2 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

--------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------- |
| | | **රු.** | |
| **(අ)** | 2015 ජුනි 19 දිනැති අංක1919-81 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | 567,802 | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරනු ලබන සියලුම දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකර ගැනීම සඳහා රීති පනවා දැන්වීම් පුවරු 138 කින් ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මුදල් රෙගුලාසි 104 | 44,190 | කසළ බැහැර කිරීමේ කටයුත්තේ යොදවා තිබූ ට්‍රැක්ටර් රථයක් 2017 අප්‍රේල් 22 දින මාර්ගයෙන් ඉවතට පැන අනතුරට |

| | | |
|---|---|---|
| | | ලක්වීම සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ආ) | 664,381 | වර්ෂ 1 සිට 7 දක්වා කාලයක් තුළ ලබාදී තිබුණු අත්තිකාරම් 2017 දෙසැම්බර් 15 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. තවද මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන්ට ද අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 571(3) | 1,506,112 | වර්ෂ 02 - 06 දක්වා කාලයකට අදාළ තැන්පතු 108 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 751 | 1,245,131 | ලැබෙන සියලුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු වුවත්, 2015/ 2016/ 2017 වර්ෂවල මිලදීගත් කොම්පෝස්ට් බඳුන් 485 ක් ලේඛනගත කර නොතිබුණි. |
| (ඇ) 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 10 ඡේදය | | කඩ කාමර අතුරු බදු දීම නොකළ යුතු වුවද, සුපිරි වෙළඳ සංකීර්ණයේ හා බස් නැවතුම්පොළ අසල කඩ කාමර, මුල් බදු කරුවන් විසින් අතුරු බදු දී රු.10,500 සිට රු.30,000 දක්වා කුලී අයකර තිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 | | |
| (i) 3.4 | 115,000 | ප්‍රසම්පාදන විධිවිධාන වලින් බැහැරව පදික වේදිකාවක් අලුත්වැඩියා කිරීම සඳහා කුට්ටිගල් 3500 ක් මිලදී ගෙන තිබුණි. |
| (ii) 3.4 (ඇ) | 3,000,000 | ප්‍රසම්පාදන විධිවිධාන වලින් බැහැරව ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 4 ක් පිරිනැමීම සිදු කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,890,776 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,918,138 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 14,465,399 | 16,637,619 | 13,191,497 | 12,460,213 | 13,713,230 | 14,465,399 | 13,825,480 | 14,842,543 |
| කුලී | 19,778,798 | 18,316,311 | 17,227,508 | 2,661,611 | 16,046,480 | 19,778,798 | 17,134,681 | 2,420,348 |
| බලපත්‍ර ගාස්තු | 1,573,720 | 1,558,479 | 1,558,479 | - | 1,196,000 | 1,573,720 | 1,593,010 | - |
| වෙනත් ආදායම් | 10,486,880 | 12,849,030 | 16,172,072 | 2,680,747 | 11,875,000 | 10,486,880 | 18,417,745 | 1,914,665 |
| | 46,304,797 | 49,361,439 | 48,149,556 | 17,802,571 | 42,830,710 | 46,304,797 | 50,970,916 | 19,177,556 |

## 2.2.2 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.13,973,462 ක හිඟ ශේෂයක් පැවතියද, වර්ෂය තුළ ඉන් අයකරගෙන තිබුණේ රු.5,213,895 ක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් හා බදු ශේෂය රු.11,519,631 ක් විය.

## 2.2.3 කුලී

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.2,420,349 ක හිඟ බදු කුලියක් පැවතියද, වර්ෂය තුළ ඉන් අයකරගෙන තිබුණේ රු.635,167 ක් පමණි.

## 2.2.4 වෙනත් ආදායම්

(අ) රථ වාහන කුලී ආදායම්

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.2,420,349 ක හිඟ ශේෂයක් පැවති අතර, ඉන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.635,167 ක් පමණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟය රු.2,661,613 ක් විය.

(ආ) පොහොර විකිණීමේ ආදායම

--------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු පොහොර විකිණීමේ ආදායම රු.878,955 ක් වූ අතර, එය වසර 1 ත් 6 ත් අතර කාලයකට අදාළව අයවිය යුතුව ඇති ශේෂයකි.

(ඇ) ජල ගාස්තු

-------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.869,082 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.36,800 ක මුදලක් පමණි.

(ඇ) නගරයේ ත්‍රී රෝද රථ නැවතුම්පළ ගාස්තු විධිමත්ව අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2017 නොවැම්බර් 30 වන විට අනුමත ත්‍රීරෝද රථ නැවතුම්පළ 19 කින් රු.1,617,110 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.74,167 ක් හා මුද්දර ගාස්තු රු.2,500,000 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කාර්යසාධනය

------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 3 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු එක් කර්තව්‍යක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ප්‍රතිපාදන නොසැලසීම

---------------------------

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 80 කින් 75 ක් සඳහා පමණක් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සැලසීම නිසා කර්තව්‍යයන් 5 ක් ඉටු කළ නොහැකි වී තිබුණි.

(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු එක් කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා රු.1,000,000 ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්තව්‍යය | ඉටුකළ ප්‍රමාණයේ වටිනාකම | නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| පැරණි නගර සභා ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ ඉදිකිරීමට යෝජිත වාණිජ සංකීර්ණය | 1,000,000 | අනුමත ව්‍යාපෘතියක් නොවූ සහ වාර්ෂික හා සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර නොතිබුණ ව්‍යාපෘතියක් වෙනුවෙන් ගොඩනැගිලි සැලැස්මක් පිළියෙල කර ගෘහ නිර්මාණ ශිල්පියෙකුට මුදල් ගෙවා තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යපෘතිය ආරම්භ කර නොතිබුණි. |

(ඉ) කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| කර්තව්‍යය | ඇස්තමේන්තු පිරිවැය | ආරම්භ කළ දිනය | 2017 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| බච්චාගම සුසානභූමිය වටා වැට සෑදීම | 500,000 | 2017.11.08 | 325,089 | මායිම් ගැටලු හේතුවෙන් අවසන් කර නොමැත. |
| වොගන්ස් පාර්ක් සිට දොළොස්බාගේ පාර දක්වා විහිදෙන ගුවන් පාලම අලුත්වැඩියා කිරීම | 1,000,000 | - | - | ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමාණයට වඩා ගුවන්පාලමේ දිරාපත්වීම් පවතින බැවින් අදාළ කර්මාන්තය සිදුකළ නොහැකි බවට කොන්ත්‍රාත්කරු විසින් දන්වා තිබීම. |

(ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

2015 ජනවාරි මස 21 දින ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් ලැබී තිබුණු රු.50,000 ක මුදල 2017 දෙසැම්බර් මස වන විටත් තැන්පත් ගිණුමේ රඳවා ගැනීම හේතුවෙන් අදාළ කාර්ය ඉටු කිරීම සඳහා වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.

(උ) තිරසාර සංවර්ධන ඉලක්ක

--------------------------------

සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ජයතිලක ක්‍රීඩාංගනයේ ආපනශාලාවේ බිම් මහලේ සභාවේ අනුමැතියකින් තොරව බදුකරු විසින් කුඩා උත්සව ශාලාවක් හා සේවක කාමර 02 ක් ඉදිකර තිබුණි. මේ සඳහා ඇස්තමේන්තුවක්, මිනුම්පතක් හා බිල්පතක් පිළියෙල නොකර රු.958,095 ක් වැය වී ඇති බව තාක්ෂණ නිලධාරී විසින් ලේකම්වරයා වෙත දන්වා තිබූ නමුත්, අත්සන් කරතිබූ බදු ගිවිසුමට පටහැනිව අනවසර ඉදිකිරීම් සිදුකිරීම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය කම්කරුවෙකු විසින් පදවා තිබූ සභාව සතු ට්‍රැක්ටර් රථයක් 2017 මාර්තු 22 දින අනතුරකට පත්වීමෙන් හානියට පත් පාර්ශවය විසින් රු.300,000 ක වන්දියක් ඉල්ලුම්කර තිබූ අතර, පාඩුව තක්සේරු කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 සැප්තැම්බර් මස 09 වන දින ලැබී තිබුණු සේවකයකුට අයත් රු.23,259 ක් වැන්දඹු අනත්දරු මුදලක් 2017 දෙසැම්බර් මස වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ) සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 173 දරන කුඩා සිනමා ශාලාව ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව හා නගර සභා ආඥා පනතේ අංක 36 (ඉ) II ඡේදයට අනුකූල නොවී පෞද්ගලික පාර්ශවයක් වෙත 2011 අගෝස්තු 23 දින දීර්ඝකාලීනව බදු දී තිබුණි. ගිවිසුමෙහි 05 ඡේදය ප්‍රකාරව ඇප සුරැකුම් ලබාගෙන නොතිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට රු.500,000 ක බදු මුදලක් අය විය යුතුව තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

------------------------------------

අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය අතර, සේවක අතිරික්තතා 1 ක් හා සේවක පුරප්පාඩු 45 ක් විය.

(ආ) සේවක ණය

----------------

වර්ෂ 01 සිට වර්ෂ 29 ක කාලපරිච්ඡේදයක් තුළ ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන් 06 කගේ, සේවය අතහැර ගිය නිලධාරීන් 11 කගේ හා විශ්‍රාම ගිය නිලධාරීන් 12 දෙනෙකුගේ හිඟ සේවක ණය රු.768,396 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 පෙබරවාරි 25 දිනැති මාසික සභා තීරණයට අනුව නගර සභාව සතු නගර මාධ්‍යයේ පවතින වාණිජ ගොඩනැගිල්ලක් තක්සේරුවක් ලබා නොගෙන, එක්වන් මුදල් අය නොකර හා රු.225,000 ක අවම ලංසුවකට ටෙන්ඩර් කැඳවා රු.231,000 කට පෞද්ගලික

සමාගමට බදු දී තිබුණි. වර්ෂ 5 කට වරක් බදු කුලිය තක්සේරු කර වැඩි කිරීමට කටයුතු නොකර අඩුවන ප්‍රතිශතයකින් වැඩිකර 2008 සිට 2033 දක්වා වසර 25 කට සභාවට අවාසිදායක බදු ගිවිසුමක් මත බදු දී තිබුණි.

(ආ) සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර හා නිවාස 9 ක් බදු දීම වෙනුවෙන් එක්වන් මුදල් (key money) රු.6,884,724 හිඟව පැවති අතර, මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සුපිරි වෙළඳ සංකීර්ණයේ සේවක කාමර බදු දීමට අදාළ ගිවිසුමේ 06 වන ඡේදය ප්‍රකාරව මෙම කාමර සේවක කාමර සඳහා පමණක් යොදාගත යුතු වුවත්, 166 , 168 හා 144 කාමරවල ව්‍යාපාර පවත්වාගෙන ගොස් තිබුණි.

(ඈ) සභාව සතු ජයතිලක ක්‍රීඩාංගනයේ ආපනශාලාව පමණක් බදු ගිවිසුමක් මඟින් බදු දී තිබුණි. බදුකරු විසින් එම ගොඩනැගිල්ල ඉදිරිපිට භූමියේ ජල උද්‍යානයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර, ඒ සඳහා ටිකට්පත්වලින් සියයට 25 ක ආදායමක් පමණක් සභාවට ලබා දී තිබීමෙන් සභාව සතු භූමිය අවිධිමත් ලෙස පරිහරණය කිරීමට ඉඩ සලසා තිබුණි.

(ඉ) 2015 වර්ෂයේ පෙබරවාරි මාසයේදී රු.281,500 ක් ගෙවා ලබාගෙන තිබුණු කොන්ක්‍රීට් කොම්පෝස්ට් බඳුන් 100 සම්බන්ධව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, 2016 හා 2017 වර්ෂවල සභාවට ලැබී තිබූ ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුන් 385 කින් 185 ක් සභා පරිශ්‍රයේ ගබඩා කර තිබුණු අතර, බඳුන් 25 ක් සභාවට කිසිදු සබඳතාවයක් නොමැති පුද්ගලයකුගේ නිවසක ගබඩා කර තිබුණි. විගණනයට ඉදිරිපත් නොකළ බඳුන් ප්‍රමාණය 154 ක් විය.

(ඊ) වරිපනම් බදු වසර 5 කට වරක් තක්සේරු කළ යුතු වුවත්, 2009 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත 2017 වර්ෂය දක්වාම වරිපනම් අය කිරීම හේතුවෙන් විශාල ආදායමක් සභාවට අහිමි වී තිබීම හා නව වරිපනම් ඒකක හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(උ) සභාව සතු වත්කම් නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකර හා එක්වන් මුදල (key money) අය නොකර බදු දීමට කටයුතු කර තිබුණි.

(ඌ) මෙහෙවර ප්‍රකාශය අනුව සභා බල ප්‍රදේශයේ සෞඛ්‍ය සේවාව කාර්යක්ෂමව කළමණාකරණය කරමින් ආදර්ශමත් පුරවරයක් බිහි කිරීම සිදුකළ යුතු වුවත්, මහජනයාට පවතින සෞඛ්‍ය ගැටලු සම්බන්ධ සභාවට ලැබී තිබුණු පැමිණිලි 6 ක් හා වෙනත් පැමිණිලි 3 ක් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(එ) වීථි පහන් සම්බන්ධයෙන් 2017 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල ලැබී තිබුණු පැමිණිලි 16 ක් සම්බන්ධව 2017 දෙසැම්බර් 15 දින වන විටත් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඒ) සභාව සතු වෙළඳ සංකීර්ණවල බදු කුලිය වසර 05 කට වරක් ප්‍රතිශෝධනය කළ යුතු වුවත්, බදු දී වසර 06 ක් ගත වුවද, මාසික බදු කුලිය ප්‍රතිශෝධනය කර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය
------------------------------

3.5.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම
----------------------------------------------------------

කුලී නොගෙවීම මත මුද්‍රා තබා ඇති නිවාස 2 ක් හා කඩ කාමර 8 ක් මාස 02 සිට මාස 16 දක්වා අතර කාලයක සිට පවරා ගෙන නැවත බදු දීමට කටයුතු නොකිරීම නිසා සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

3.5.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,505,000 ක වටිනාකම වූ වත්කම් 2 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) කාර් රථයක් රු.478,186 ක් වැයකර අලුත්වැඩියා කර තිබූ නමුත්, 2017 දෙසැම්බර් මස 15 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ ගාල් කර තිබුණි.

3.6 දෘශ්‍ය අක්‍රමිකතා

------------------

සභාව සතු කොත්මලේ පාරේ පිහිටි අංක 153 දරන ගොඩනැගිල්ල නගර සභා ආඥා පනතේ 36(ඉ)II වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන හා විධිමත් ටෙන්ඩර් පටිපාටියකින් බැහැරව දීර්ඝකාලීනව බදු දී තිබූ අතර, අය කර ගත යුතු එක්වන් මුදලද (key money) අයකර නොතිබුණි. තවද, නොතාරිස්වරියෙකු ඉදිරියේ 2015 මැයි 17 වන දින ලියනලද පවරා දීමේ පොරොන්දු ගිවිසුමක් මගින් බදුකරුවන් විසින් සභාපතිවරයා වෙත රු. ලක්ෂ 20 ක එක්වන් මුදලක් (key money) ලබා දී ඇති බව විගණනයට සනාථ විය.

3.7 ප්‍රසම්පාදනය

----------------

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------

සමාලෝචිත වර්ෂයේ රු.5,064,699 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබූ නමුත්, ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.7.2 සැපයීම් හා සේවා

---------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කැබ් රථයක් 2015 වර්ෂයේදී අඹතැන්න යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයෙන් රු.642,800 ක ඇස්තමේන්තුවකට අලුත්වැඩියා කර ඇතත්, අලුත්වැඩියාවන් නිසි පරිදි සිදුකර නොතිබුණි. මෙම රථය නැවත අලුත්වැඩියාව සඳහා එම ආයතනයටම යවා ඇතත්, දෙවන වර අලුත්වැඩියාවෙන් පසු යාන්ත්‍රික ඉංජිනේරුවයෙකු හෝ මෝටර් රථ පරීක්ෂකවරයෙකු ලවා වාහනය පරීක්ෂා කර වාර්තා ලබාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය .

(ආ) බාර්කෝඩ් ලේබල් 20,000 ක් හා බාර්කෝඩ් ප්‍රින්ට් කාබන් 02 ක් සඳහා පෞද්ගලික ආයතනයක් රු.27,760 ක් ලෙස මිල ගණන් ඉදිරිපත් කර තිබූ නමුත්, එම මිල ප්‍රතික්ෂේප කර රු.35,600 කට මිලදී ගැනීම නිසා රු.7,840 ක පාඩුවක් රජයට සිදුව තිබුණි. මෙහිදී අවම මිල ප්‍රතික්ෂේප කිරීමට හේතු අනාවරණය නොවීය.

(ඇ) පරිගණක 5 ක් මිලට ගැනීමේදී රු.95,000 ක අවම මිල ප්‍රතික්ෂේප කර රු.101,000 බැගින් ගෙවා මිලදී ගැනීම හේතුවෙන් රු.30,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) සෞඛ්‍ය අංශය සඳහා එකක් රු.2,750 බැගින් ගම් බූට්ස් 50 ක් රු.137,500 කට මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදනයේදී එම බූට්ස් සඳහා රු.1,950 ක අවම මිල ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් රු.40,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයන් 53 ක් සඳහා සලසා දී තිබුණු රු.6,451,200 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයන් 54 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 7 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) ආදායම් විෂයන් 2 ක ඇස්තමේන්තු කර තිබූ රු. 60,000 ක ආදායමෙන් කිසිදු ඉපයීමක් සිදු කර නොතිබුණි.

(ඈ) ආදායම් විෂයන් 19 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර සියයට 10 සිට සියයට 99 අතර පරාසයක විචලනයක් පවතුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය නොකිරීම. |
| | | (ii) | සභාව සතු ඉඩම් විධිමත් අනුමැතියකින් තොරව පැවරීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | සභාව සතු සියලු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| | | (ii) | ණයහිමි ශේෂ අඩුවෙන් ගිණුම්ගත කිරීම. |
| | | (iii) | ණය පොලිය අඩුවෙන් ගිණුම්ගත කිරීම. |
| (ඇ) | මුදල් හා බැංකු කටයුතු | (i) | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පැවතීම. |
| | | (ii) | අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| (ඈ) | වාහන පාලනය | (i) | වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා නොකිරීම. |
| | | (ii) | භාවිතයෙන් ඉවත්කළ වාහන අපහරණය නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ආදායම් පාලනය | (i) | කාලීනව වරිපනම් බදු තක්සේරු නොකිරීම. |
| | | (ii) | හිඟ ආදායම් අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඊ) | ණයගැතියෝ සහ ණයහිමියෝ | (i) | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | කර්මාන්ත ණයහිමි ශේෂය පියවීමට කටයුතු නොකිරීම. |
| (උ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) | ප්‍රසම්පාදනය සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා නොදීම. |
| | | (ii) | ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් දක්නට ලැබීම. |
| | | (iii) | චක්‍රලේඛ වලට පටහැනිව කොන්ත්‍රාත් ප්‍රදානය නොකිරීම. |